" විශිෂ්ට රාජ්‍ය සේවාවක් සඳහා ඇප කැපවෙමු "

**ප්‍රධාන ලේකම් කාර්යාලය - බස්නාහිර පළාත**

**பிரதான செயலாளர் அலுவலகம் - மேல் மாகாணம்**

**OFFICE OF THE CHIEF SECRETARY - WESTERN PROVINCE**

204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
204, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்ல.
204, Denzil Kobbekaduwa Mawatha, Battaramulla.

SLSI ISO 9001 — SLAB ACCREDITED ISO/IEC: 17021 QMS-001-01

| ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary | දුරකථන / தொலைபேசி / Telephone - 011 - 2092599<br>ෆැක්ස් / பெக்ஸ் / Fax - 011 - 2092601<br>ඊ-මේල් / மின்னஞ்சல் / E-mail - chiefsecretary@wpc.gov.lk | පොදු දුරකථන / தொலைபேசி இலக்கம் / General Telephone | 011 - 2093000 |
|---|---|---|---|

| මගේ අංකය / எனது இலக்கம் / My No. | CSWP/PTR/5-15/FI/1 | ඔබේ අංකය / உமது இலக்கம் / Your No. | | දිනය / திகதி / Date | 2022. 12 |
|---|---|---|---|---|---|

අධ්‍යක්ෂ,
තොරතුරු තාක්ෂණ සම්පත් සංවර්ධන අධිකාරිය,
බස්නාහිර පළාත

**<u>බස්නාහිර පළාත් තොරතුරු තාක්ෂණ සම්පත් සංවර්ධන අධිකාරියේ තාක්ෂණික නිලධාරීන් සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය- 2022</u>**

බස්නාහිර පළාත් තොරතුරු තාක්ෂණ සම්පත් සංවර්ධන අධිකාරියේ උපදේශක හා තොරතුරු තාක්ෂණ සහකාර නිලධාරීන් සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයට අයදුම්පත් මෙයින් කැඳවනු ලැබේ.

02. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය - 2023.01.30

03. සුදුසුකම් : බස්නාහිර පළාත් තොරතුරු තාක්ෂණ සම්පත් සංවර්ධන අධිකාරියේ උපදේශක හා තොරතුරු තාක්ෂණ සහකාර 111 වන ශ්‍රේණියේ නිලධාරීන් මෙම විභාගය සඳහා සුදුසුකම් ලබයි.

04. අයදුම්පත්‍රය මෙම නිවේදනයේ පහත දක්වා ඇති ආදර්ශ ආකෘතියට අනුකූල විය යුතුය. එම ආදර්ශ අයදුම්පත්‍රය අනුව අපේක්ෂකයින් ස්වකීය අයදුම්පත පිළියෙල කරගත යුතුය. ඒ අනුව පිළියෙල කර ගත් අයදුම්පත්‍ර අපේක්ෂකයන් විසින් සිය දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් **2023.01.30** වන දින හෝ ඊට පෙර ලැබෙන සේ **"නියෝජ්‍ය ප්‍රධාන ලේකම්(පිරිස් හා පුහුණු), ප්‍රධාන ලේකම් කාර්යාලය (බ.ප.), පිරිස් හා පුහුණු අංශය, 204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල"** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් ලද බව දන්වනු නොලැබේ. නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත්, සහ අවශ්‍ය සුදුසුකම් සපුරා නොමැති සහ අසම්පූර්ණ අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

05. අපේක්ෂකයින්ගේ අනන්‍යතාවය සනාථ කිරීම සඳහා පහත සඳහන් ලියවිලි වලින් එකක් ශාලාධිපති වෙත ඉදිරිපත් කල යුතුයි.

i. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත
ii. වලංගු විදේශ ගමන් බලපත්‍රය
iii. වලංගු රියදුරු බලපත්‍රය

06. මෙම විභාගය සඳහා ප්‍රථම වරට පෙනී සිටින නිලධාරීන් විසින් කිසිදු විභාග ගාස්තුවක් ගෙවිය යුතු නොවේ. එසේ නොවේ නම් අයදුම්කරුවන් සම්පූර්ණ විභාගය සඳහා රු. 400/- ක්ද, එක් විෂයක් සඳහා පමණක් පෙනී සිටින්නේ නම් රු. 300/- ක් ද විභාග ගාස්තු වශයෙන් ගෙවිය යුතුය. තවද මෙම විභාග

| නියෝජ්‍ය ප්‍රධාන ලේකම් / பிரதி பிரதான செயலாளர் / Deputy Chief Secretary | පාලන / நிர்வாகம் / Administration | පිරිස් හා පුහුණු / ஆளணி மற்றும் பயிற்சி / Personnel & Training | මුදල / நிதி / Finance | සැලසුම් / திட்டமிடல் / Planning | ඉංජිනේරු / பொறியியல் / Engineering | ප්‍රධාන අභ්‍යන්තර විගණක / பிரதான உள்ளக கணக்காய்வாளர் / Chief Internal Auditor |
|---|---|---|---|---|---|---|
| | Tel : 0112092606<br>Fax : 0112092609<br>dcsadmin@cs.wpc.gov.lk | Tel : 0112092631<br>Fax : 0112092647<br>dcspt@cs.wpc.gov.lk | Tel : 0112092640<br>Fax : 0112092636<br>dcsfinance@cs.wpc.gov.lk | Tel : 0112092532<br>Fax : 0112092533<br>dsplan@cs.wpc.gov.lk | Tel : 0112092501<br>Fax : 0112092505<br>dcs@eng.wpc.gov.lk | Tel : 0112092628<br>Fax : 0112092625<br>cia@cs.wpc.gov.lk |

ගාස්තුව බස්නාහිර පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලයේ මූල්‍ය අංශයට ගෙවා ලබා ගන්නා ලද බ.ප.1 ලදුපත නොගැලවෙන සේ අයදුම්පතේ නියමිත ස්ථානයේ අලවා එවිය යුතුය.

07. විභාග පරිපාටිය - අපේක්ෂකයින් පහත දැක්වෙන විෂයන් ඇතුළත් ලිඛිත පරීක්ෂණයකට පෙනී සිටිය යුතුය.

| විෂයය අංකය | විෂයය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|---|
| 01 | කාර්යාල පරිපාලනය/පිරිස් පාලන පරිපාටි | පැය 01 | 100 | 40 |
| 02 | මූල්‍ය පරිපාලන පරිපාටි | පැය 01 | 100 | 40 |

08.විභාගය සඳහා විෂය නිර්දේශය -

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| 1. කාර්යාල පරිපාලනය/පිරිස් පාලන පරිපාටි<br>2. මූල්‍ය පරිපාලන පරිපාටි | සාමාන්‍ය කාර්යාල ක්‍රම සහ පිරිස් පරිපාලන ක්‍රමවේදයන් සහ මූල්‍ය පරිපාලන පරිපාටින් පිළිබඳව තම සේවයට අදාල දැනුම |

09. විභාගය 2023 පෙබරවාරි මසදී පැවැත්වීමට කටයුතු කෙරේ.

10. මෙම අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ අදාල කරුණු හෝ එම නිවේදනයෙන් ආවරණය නොවන වෙනත් කරුණක් වෙතොත් ඒ පිළිබඳව අවසන් තීරණය බස්නාහිර පළාත් ප්‍රධාන ලේකම් සතු වන්නේය.

ජේ.එම්.සී.ජයන්ති විජේතුංග
ප්‍රධාන ලේකම්
බස්නාහිර පළාත.

**ආදර්ශ අයදුම් පත්‍රය.**

**බස්නාහිර පළාත් තොරතුරු තාක්ෂණ සම්පත් සංවර්ධන අධිකාරියේ උපදේශක/තොරතුරු තාක්ෂණ සහකාර සේවයේ III වන පන්තියේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය- 2022**

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය
( අදාල කොටුව තුළ X ලකුණ යොදන්න) සිංහල ☐ දෙමළ ☐ ඉංග්‍රීසි ☐

1.0
1.1 මුලකුරු සමග නම : ..............................................................................
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
1.2 සම්පූර්ණ නම : ..............................................................................
( සිංහලෙන්)
1.3 සේවා ස්ථානයේ නම හා ලිපිනය : ..............................................................................

1.4 ජාතික හැඳුනුම්පත් අංකය : ☐☐☐☐☐☐☐☐☐☐

2.0
2.1 ස්ථිර ලිපිනය : ..............................................................................

2.2 ස්ත්‍රී පුරුෂ භාවය - ස්ත්‍රී ☐ පුරුෂ ☐

2.3 දුරකථන අංකය- පෞද්ගලික- ...................... රාජකාරි - ......................

3.0. ඔබ මෙවර විභාගයේදී පෙනී සිටන විෂයය / විෂයන්

| අනු අංකය | විෂයය | විෂයය අංකය |
|---|---|---|
| | | |
| | | |

3.0. විභාග ගාස්තු ගෙවූ ලදුපත් අංකය - ..................... දිනය - ..........................
ලදුපත් ලබා ගත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය :

ලදුපත මෙම කොටුව තුල නොගැලවෙන සේ අලවන්න.

**අයදුම්කරුගේ සහතිකය**

පසු පිට සඳහන් විස්තර නිවැරදි බවත්, ඉහතින් දක්වා ඇති භාෂා මාධ්‍යයෙන් විභාගයට පෙනී සිටීමට මට හිමිකම් ඇති බවත්, විභාගයට පෙනී සිටින්නේ ............ වතාවට බැවින් විභාග ගාස්තු ගෙවීම අනවශ්‍ය බවත් / විභාග ගාස්තු ගෙවන ලද අංක ........................ හා ............................. වැනි දින දරණ මුදල් කුවිතාන්සිය මෙයට අලවා ඇති බවත් ප්‍රකාශ කරමි. තවද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් පනවනු ලබන නීතිරීති වලට මම යටත් වන බවද ප්‍රකාශ කරමි

.......................................  ..........................................................

දිනය  අයදුම්කරුගේ අත්සන.

**අයදුම්කරුගේ අත්සන සහතික කිරීම.**
( අනවශ්‍ය වචන කපා හරින්න.)

මගේ කාර්යාලයේ නිලධාරියෙකු / නිලධාරිනියක සහ මා පෞද්ගලික වශයෙන් දන්නා හඳුනන .................................................. මයා/මිය/මෙනවිය ................................................ දින මා ඉදිරිපිට දී ඔහු/ඇයගේ අත්සන තැබූ බවත්, ඔහු/ඇය විභාගයට පෙනී සිටින්නේ ............ වතාවට බැවින් විභාග ගාස්තුවෙන් නිදහස් කිරීමට සුදුසු බවත් / විභාග ගාස්තු ගෙවා ඇති බවත්, සහතික කරමි.

...............................  ................................................

දිනය  සහතික කරන නිලධාරියාගේ අත්සන
තනතුර හා නිල මුද්‍රාව

නම - .....................................
පදවි නාමය - .....................................
ලිපිනය - .....................................
දිනය - .....................................

**ආයතන ප්‍රධානියාගේ සහතිකය**

ඉහත සපයා ඇති විස්තර පරීක්ෂා කර බැලූ බවත්, මෙම නිලධාරියා / නිලධාරිනිය මෙම විභාගයට පෙනී සිටීමට සුදුස බවත් සහතික කරමි.

...............................  ................................................

දිනය  ආයතන ප්‍රධානියාගේ අත්සන
තනතුර හා නිල මුද්‍රාව